# පටුන

හැඳින්වීම........................................................................................................ 03

දැක්ම , මෙහෙවර, ආයතන සංයුතිය.................................................................. 04

මූලික අපේක්ෂාවන්, ප්‍රධාන උපාය මාර්ග සංවර්ධන අරමුණු, .................................... 05

කාර්ය මණ්ඩල විස්තරය (2016.12.31) ......................................................................06-07

ජාත්‍යන්තර දින සැමරුම්.......................................................................................08

**ආංශීය කාර්ය සාධනය**

පාලන අංශය........................................................................................................ 09-10

ගිණුම් අංශය........................................................................................................ 11-13

අභ්‍යන්තර විගණන අංශය........................................................................................13-14

සැලසුම් අංශය....................................................................................................15-16

සංවර්ධන අංශය..................................................................................................17-19

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය................................................................................20-26

ජාතික කාන්තා කමිටුව.........................................................................................27-29

ළමා ලේකම් කාර්යාලය........................................................................................30-39

*කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ*

*2016 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව*

*2002 සැප්තැම්බර් 12 දිනැති*

*රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි*

*උපදෙස් පරිදි පිළියෙල කර ඇත.*

# හැඳින්වීම

ශ්‍රී ලාංකේය කාන්තා හා ළමා පරපුරේ උන්නතිය උදෙසා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.09.21 දිනැති අංක 1933/13 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් පවරා දෙන ලද කාර්යයන්, ක්‍රියාවට නැංවීම උදෙසා අදාළ පරිදි අමාත්‍යාංශය වෙත සුවිශේෂී කාර්යය භාරයක් පැවරී ඇත.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය හා කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ හිංසනයන් පිටුදැකීම පිළිබඳ සම්මුතියේ සඳහන් කරුණු ඇතුළත්වූ කාන්තා ප්‍රඥප්තිය පාදක කරගෙන ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නීති සම්පාදනය, ප්‍රතිපත්ති සකස් කිරීම, වැඩසටහන් මෙහෙයවීම යන කාර්යයන්, අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන විසින් සාර්ථකව ක්‍රියාවට නංවා ඇත.

ළමුන් හා කාන්තාවන් සම්බන්ධ නීති, ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම, යටිතල පහසුකම් සංවර්ධනය, කාන්තා හා ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාවට නැංවීම ඒවා පසු විපරම් කිරීම මෙන්ම අනාගත ප්‍රතිපත්ති සම්පාදනයට දායක කර ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීමත්, ළමුන් හා කාන්තා සංවර්ධනයට දායක වන දත්ත පද්ධතිය සකස් කිරීමත්, 2016 වසර තුළ ක්‍රියාත්මක වූ ප්‍රධාන කාර්යයන් විය.

ඒ අනුව 2016 වර්ෂයේ දී ග්‍රාමීය ආර්ථික සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදන වලින් 25% ක් කාන්තාවන් උදෙසා යෙදවීම, හිංසනයෙහි වින්දිතයන් බවට පත්වන කාන්තාවන් උදෙසා ආරක්ෂාව සැලසීම වෙනුවෙන් වූ තාවකාලික නිවාස පවත්වාගෙන යාම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය, කාන්තා ගෘහමූලික පවුල් සඳහා වන ජාතික සැලැස්ම, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසැල්) දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම වෙනුවෙන් වඩා ඵලදායී ක්‍රමවේදයක් යෝජනා කිරීම, ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2016 – 2020 යන විශේෂ ප්‍රතිපත්ති සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී.

2014 වර්ෂයේ ආරම්භ කරන ලද ළමා කාන්තා සංවර්ධන ඒකක ශක්තිමත් කිරීම හා ළමා අපයෝජන හා කාන්තා හිංසන වැළැක්වීමේ වැඩ සටහන යටතේ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ හා කාන්තා රැකවරණ මධ්‍යස්ථාන ඉදිකිරීමේ කටයුතු මෙම වසරේ දී සිදු කර ඇත.


## දැක්ම

ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත වන්නා වූ අභිමානවත් දේශයක් කරා

## මෙහෙවර

අභිමානවත් දේශයක් වෙනුවෙන් සමාජ ආර්ථික බලගැන්වීම, සමාජ වටිනාකම් ප්‍රවර්ධනය සහ අදාළ සියලු පාර්ශවයන්ගේ උපාය මාර්ගික ඒකාබද්ධ සහභාගිත්වය ලබාගැනීම මඟින් ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාළ අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.

## ආයතනික සංයුතිය



## මූලික අපේක්ෂාවන්

- ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය උදෙසා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම.
- කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සංවර්ධනය උදෙසා ජාතික සැලැස්මක් සකස් කිරීම.
- ළමා හා කාන්තා සංවර්ධනය සඳහා යාන්ත්‍රණයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන, විදේශ ආයතන සහ පෞද්ගලික අංශ සම්බන්ධීකරණය කරමින් ළමා හා කාන්තා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ළමා හා කාන්තා ආරක්ෂණය සහ සංවර්ධනය සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශය සහ ඊට අයත් නියෝජිත ආයතන මඟින් සිදු කරනු ලැබූ ආරක්ෂණ සහ සංවර්ධන වැඩ සටහන් අධීක්ෂණය කිරීම.
- ළමුන් හා කාන්තාවන් සම්බන්ධව ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටින සියලුම ජාත්‍යන්තර සම්මුතීන් හා එකඟතාවයන් සඳහා නීති, ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය.
- ළමා අපයෝජනය පිටු දැකීමෙහිලා අවශ්‍ය නෛතික හා ජාතික ප්‍රතිපත්තීන්ගෙන් සැදි පරිසරයක් ස්ථාපිත කිරීම.

## උපාය මාර්ග සංවර්ධන අරමුණු

- ඉහළ ගුණාත්මක භාවයකින් යුතු මුල් ළමාවිය සංවර්ධන හා රැකවරණ සේවාවක් තහවුරු කිරීම.
- නිවාසගත ළමුන්ගේ සුබසාධනය උදෙසා අයිතිවාසිකම් තහවුරු කිරීම හා ඔවුන් සමාජගත කිරීම.
- ළමා අපයෝජන වැළැක්වීම හා අවම කිරීම.
- අනාරක්ෂිත කාන්තා පවුල් සංවර්ධනය.
- ළමුන්ගේ හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නීති හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම.
- ශ්‍රී ලංකාව බැඳී සිටින ජාත්‍යන්තර සම්මුතීන්ට ගැලපෙන දේශීය ළමා හා කාන්තා සංවර්ධන ක්‍රමෝපායන් ස්ථාපිත කිරීම.

## කාර්ය මණ්ඩල විස්තරය (2016.12.31 දිනට)

| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය පන්තිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | |
| **01.** | ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | | 01 | 01 |
| **02.** | රාජ්‍ය ලේකම් (ළමා) | ශ්‍රී.ලං.ප.සේ | (විශේෂ) | 01 | 01 |
| **03.** | අතිරේක ලේකම් (පාලන හා මුදල්) | ශ්‍රී.ලං.ප.සේ | (විශේෂ) | 01 | 01 |
| **04.** | අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ | (විශේෂ) | 01 | 01 |
| **05.** | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | SL-1 | 01 | 01 |
| **06.** | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | SL-1 | 01 | 01 |
| **07.** | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | SL-1 | 01 | 01 |
| **08.** | අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ | SL-1 | 01 | 01 |
| **09.** | අධ්‍යක්ෂ (කාන්තා කාර්යාංශය) | ශ්‍රී.ලං.ප.සේ | SL-1 | 01 | 01 |
| **10.** | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ | SL-1 | 01 | 01 |
| 11. | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | SL-11/111 | 02 | 02 |
| 12. | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | SL-11/111 | 05 | 05 |
| 13. | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.ස.සේ | SL-11/111 | 02 | 02 |
| 14. | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | SL-1 11/111 | 02 | 02 |
| 15. | සහකාර අධ්‍යක්ෂ (ICT) | ශ්‍රී.ලං.තො.තා.සේ. | 1 පන්තිය 111 ශ්‍රේණිය | 01 | 01 |
| 16. | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.තො.තා.සේ. | 111/11 | 01 | 01 |
| 17. | නීති නිලධාරි | දෙපාර්තමේන්තුගත | 111/11 | 03 | 03 |
| | **තෘතීක මට්ටම** | | | | |
| **18.** | පරිපාලන නිලධාරි | රාජ්‍යකළමනාකරණ සහකාර සේවය (අධිපන්තිය) | MN-07 | 01 | 01 |
| **19.** | පර්යේෂණ නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-06 | 01 | 01 |
| **20.** | භාෂා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි හා දෙමළ/සිංහල | භාෂා පරිවර්තක සේවය | MN-06 | 02 | 01 |
| **21.** | උපදේශන නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-05 | 13 | 10 |

### ද්විතීක මට්ටම

| | | | | | |
|---|---|---|---|---|---|
| 22. | සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා | MN-04 | 24 | 22 |
| 23. | වනිතා සංවර්ධන නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-04 | 335 | 282 |
| 24. | අයවැය සහකාර | ආශ්‍රිත සේවා | MN-04 | 01 | 01 |
| 25. | සංවර්ධන නිලධාරි | සංවර්ධන නිලධාරි සේවය | MN-04 | 516 | 336 |
| 26. | පුස්තකාලයාධිපති | පුස්තකාලයාධිපති සේවය | MN-03 | 01 | - |
| 27. | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක.ස.සේ. (1,11,111) | MN-02 | 40 | 32 |
| 28. | පුස්තකාල සහකාර | දෙපාර්තමේන්තුගත | MN-01 | 01 | 01 |
| 29. | පිළිගැනීමේ නිලධාරි | දෙපාර්තමේන්තුගත | MN-01 | 01 | 01 |
| 30. | සහන සොයුරි | දෙපාර්තමේන්තුගත | MN-01 | 134 | 124 |
| 31. | නේවාසිකාගාර පාලිකා | දෙපාර්තමේන්තුගත | MN-01 | 02 | - |
| 32. | නේවාසිකාගාර පාලිකා (සහකාර) | දෙපාර්තමේන්තුගත | MN-01 | 02 | - |
| 33. | තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ස. | තො.තා.හා ස.ස | MT-01 | 03 | 02 |
| 34. | කැමරා ශිල්පි | දෙපාර්තමේන්තුගත | MT-01 | 01 | 01 |
| 35. | නිශ්චල ඡායාරූප ශිල්පි | තාවකාලික | MT-01 | 01 | 01 |

### ප්‍රාථමික මට්ටම

| | | | | | |
|---|---|---|---|---|---|
| 36. | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේ. | PL-03 | 31 | 24 |
| 37. | කැමරා ශිල්පී සහායක | තාවකාලික | PL-01 | 01 | 01 |
| 38. | කාර්යාල කාර්ය සහයක | කා.සේ.සේ | PL-01 | 25 | 20 |
| 39. | උපදේශන සේවා කම්කරු | දෙපාර්තමේන්තුගත | PL-01 | 12 | 11 |
| 40. | අරක්කැමි | දෙපාර්තමේන්තුගත | PL-01 | 02 | - |

### ළමා ලේකම් කාර්යාලය

| | | | | | |
|---|---|---|---|---|---|
| 41. | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | SL-1 1 | 01 | 01 |
| 42. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | SL-11/111 | 04 | 04 |
| 43. | මුල් ළමාවිය සංවර්ධන සහකාර | සං.නි.සේ | MN-04 | 373 | 327 |
| 44. | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. ක.ස.සේ. (1,11,111) | MN-02 | 03 | 01 |
| 45. | රියදුරු | ඒකාබද්ධ රි.සේ | විශේෂ | 02 | 01 |
| 46. | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ | විශේෂ | 03 | 03 |

# ජාත්‍යන්තර දින සැමරුම්

## ජාත්‍යන්තර *කාන්තා දිනය*

තේමාව - "සවිබල කතක් - තිරසර හෙටක්"

2016 ජාත්‍යන්තර කාන්තා දිනය මාර්තු 08 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය ගරු චන්ද්‍රානි බණ්ඩාර මැතිනියගේ මූලිකත්වයෙන් ඓතිහාසික දිගාමඩුල්ල පුරවරයේ අම්පාර වීරසිංහ ක්‍රීඩාංගනයේදී අභිමානවත් ලෙස පවත්වන ලදී. මෙම උත්සවයට සමගාමීව කාන්තා නිෂ්පාදන අලෙවිය සඳහා අවස්ථා ඇති කිරීමට නිෂ්පාදන වෙළඳ ප්‍රදර්ශනයක් පවත්වන ලදී. තවද, උපදේශන සේවාව සමාජගත කිරීම, සුවනාරී සායන, බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ සායන, ආයුර්වේද සායනය හා ජාත්‍යන්තර කාන්තා දින ජාතික උත්සවයට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 137 ක කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා වැඩසටහන් මාලාවක් ද පවත්වන ලදී.

## *ලෝක ළමා දිනය*

තේමාව- "සොඳුරු ළමා ලොව රකින්න - වැඩිහිටියනි දෑත දෙන්න"

2016 වර්ෂයේ ලෝක ළමා දින ජාතික උත්සවය ළමා රාජ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කළ අතර, එය කෑගල්ල ශාන්ත ජෝශප් බාලිකා ප්‍රාථමික විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. මෙම උත්සවයට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දැනුවත් කිරීමේ වැඩ සටහන් හා පෙර පාසැල් දරුවන් සඳහා රසවින්දනාත්මක වැඩ සටහන් ද ක්‍රියාත්මක කරන ලදී.

## *ජාත්‍යන්තර ගැහැණු දරුවාගේ දිනය*

ඔක්තෝබර් 11 දිනට යෙදී ඇති මෙම ජාතික දිනය වෙනුවෙන් "දියණියේ ඔබට නිදහස් ලොවක් අවැසියි. සුරක්ෂිත පරිසරයක පරිපූර්ණ වීමට අපි ඔබට අත දෙමු !" යන තේමාව යටතේ පවත්වන ලද ජාතික වැඩසටහන 2016.10.11 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පෙ.ව. 9.00 සිට ප.ව. 12.30 දක්වා පවත්වන ලද අතර, මෙයට සමගාමීව "ලිංගික කටයුතු සඳහා කැමැත්ත දිය හැකි වයස අවුරුදු 16 ලෙසත්, විවාහ වීමට ඇති වයස අවුරුදු 18 ලෙසත් නීතියේ සඳහන් වන කාරණා පිළිබඳ විවෘත සංවාදයක්" මෙදිනම ප.ව. 1.00 සිට ප.ව. 4.00 දක්වා ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

## පාලන අංශය

### ප්‍රධාන කාර්යභාරය

01. අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සම්බන්ධ ආයතනික කටයුතු, සම්බන්ධීකරණය හා විනය කාර්යයන් පවත්වාගෙන යාම.
02. අමාත්‍යාංශයට අනුමත වූ තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම.
03. අමාත්‍යාංශයේ ව්‍යාපෘති හා කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය නව තනතුරු මු.රෙ.71 ට අනුව ඇති කිරීමට කටයුතු කිරීම.
04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 ට අනුව දෙපාර්තමේන්තු තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි / උසස් කිරීමේ පරිපාටි සංශෝධනයන් සකස් කර අනුමත කර ගැනීම හා උසස් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම. නව තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි සකස් කර අනුමත කරවා ගැනීම.
05. අමාත්‍යාංශයට අයත් අංශ /ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම හා වෙනත් සම්බන්ධිත කාර්යයන් සිදු කිරීම. (අයවැය කාරක සභාව, ගිණුම් කාරක සභාව,පෙත්සම් කාරක සභාව, කල්තැබීමේ යෝජනා සම්බන්ධයෙන් කටයුතු)
06. අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
07. මහජන දුක්ගැනවිලි සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
08. අමාත්‍ය කාර්යාලය හා රාජ්‍ය අමාත්‍ය කාර්යාලයට අයත් කාර්යය මණ්ඩලයේ ආයතනික කටයුතු සිදුකිරීම.
09. තැපැල අංශ වලට බෙදා හැරීම හා පිටතට යැවෙන ලිපි තැපැල් කිරීම.
10. සැපයුම් හා සේවා පවත්වාගෙන යාම (ආරක්ෂක, පිරිසිදු කිරීම්, විදුලි බිල්පත්, ජල බිල්පත්, පුවත්පත්, ප්‍රවාහන පහසුකම්, දුරකථන, දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර, දුම්රිය ගමන් බලපත්‍ර, සංග්‍රහ කටයුතු, වාහන රක්ෂණය)
11. වාහන සංචිතය පවත්වාගෙන යාම, වාහන අපහරණය කිරීම , අලුත්වැඩියා කිරීම හා අලුත් වාහන මිලදී ගැනීම.
12. ගොඩනැගිලි හා උපකරණ නඩත්තු කටයුතු.
13. අත්තිකාරම් ණය, උත්සව අත්තිකාරම්, විශේෂ අත්තිකාරම්, ආපදා ණය, දේපල ණය හා අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ ආයතනික කටයුතු.
14. බියගම කාන්තා සෙවණ නේවාසිකාගාර කටයුතු.
15. අමාත්‍යාංශයීය කාර්යය මණ්ඩලය සඳහා ආයතන හා මූල්‍ය කටයුතු පිළිබඳව පුහුණු වැඩ සටහන් පැවැත්වීම.
16. අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු

## ➢ කාර්ය මණ්ඩල කටයුතු

2016.12.31 දිනට අමාත්‍යාංශය සඳහා අනුමත මුළු සේවක සංඛ්‍යාව 1561 කි. එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 339 කි. 2016 වසර තුළ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින් අට දෙනෙකු ලබා ගැනීමට හැකි විය. ඊට අමතරව පර්යේෂණ නිලධාරියෙකු සහ නීති නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීමට හැකි විය.

කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ක්‍රමවත්ව පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම, එදිනෙදා නිවාඩු සම්බන්ධ රාජකාරී, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරුවීම්, විශ්‍රාම ගැන්වීම් ආදී පරිපාලන කටයුතු නිසි පරිදි සිදු කර ඇත. එසේම අමාත්‍ය කාර්ය මණ්ඩලය හා රාජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ ද ආයතන හා පරිපාලන කටයුතු අදාළ පරිදි සිදු කර ඇත.

අමාත්‍යාංශයට අයත් සියලුම නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය, තාක්ෂණික හැකියාව සහ භාෂා ප්‍රවීණතාවය ඉහළ නැංවීම අරමුණු කරගෙන දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් අඛණ්ඩව යොමු කර ඇත.

ඒ අනුව රියදුරන් සඳහා  වාහන නඩත්තුව පිළිබඳව යාන්ත්‍රික පුහුණු, ඵලදායිතා ක්‍රමවේදය පිළිබඳව පුහුණුකරුවන් පුහුණු කරවීම, MS Excel advanced analysis tools පුහුණුව, වැඩ අධ්‍යයන හා ක්‍රම අධ්‍යයන වැඩ සටහන්  හා නිලධාරීන්ගේ මානසික සංවර්ධනය උදෙසා ගී රස වින්දන වැඩ සටහන් ආදී වශයෙන් දේශීය පුහුණු කිරීම් සිදු කරන ලදි.

විධායක නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්  විදේශ පුහුණු සඳහා යොමු කර ඇත.

## ➢ අනුබද්ධ ආයතනවල කටයුතු

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යන ආයතනවල පරිපාලන කටයුතු සම්බන්ධීකරණය හා මඟපෙන්වීම සම්බන්ධයෙන් පාලන අංශය ක්‍රියාකර ඇත. උක්ත ආයතනවල රා.ප.ච 6/2006 අනුව බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය, කාර්ය මණ්ඩලයේ තනතුරු ඇති කිරීම, පත් කිරීම, උසස් කිරීම, කාර්ය මණ්ඩලයේ සේවා ගැටළු පිළිබඳව අමාත්‍යාංශයට ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධ කටයුතු නිසි පරිදි සිදු කර ඇත. එසේම මෙම ආයතනවල නිලධාරින්ගේ විදේශ සංචාර, ශිෂ්‍යත්ව, පුහුණු පාඨමාලා සඳහා අනුමැතිය ලබා දීම ද අදාළ පරිදි නිවාඩු ලබා දීම ද සිදු කර ඇත.

## ➢ ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු

කාර්යක්ෂම මහජන සේවයක් හා ප්‍රියමනාප කාර්යාල පරිශ්‍රයක් ඇති කිරීම සඳහා  අමාත්‍යාංශය ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. එසේම ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් පවත්වනු ලබන ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියට ඉදිරිපත් වී තෙවන ස්ථානය හිමිකර ගන්නා ලදී.

ගිණුම් අංශය

## ප්‍රධාන කාර්යභාරය

මුදල් විෂය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමඟ විධිමත් සම්බන්ධීකරණයක් ඇති කර ගනිමින් එම සැලසුම් ක්‍රියාත්මක කරවීමේ කටයුතු, ව්‍යාපෘති ද ඇතුළුව අමාත්‍යාංශයේ ගිණුම් හා ගෙවීම් කටයුතු සම්බන්ධව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම, අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු අත්තිකාරම් "බී" ගිණුම ඇස්තමේන්තු හා පරිපූරක ඇස්තමේන්තු කාලීනව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම, අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු ව්‍යාපෘති හා ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික අයවැය හා පරිපූරක ඇස්තමේන්තු සකස් කිරීම් සම්බන්ධීකරණය, අමාත්‍යාංශය ඇතුළු ඒ යටතේ ඇති සියලුම ආයතනවල නිල බැංකු ගිණුම් විවෘත කිරීම, මෙහෙයවීම, වසා දැමීම සම්බන්ධ කටයුතු, අනුමත ඇස්තමේන්තු පදනම් කර ගෙන ක්‍රියාකාරී ප්‍රාග්ධන සැලැස්ම සැකසීම හා අක්මුදල් පුරෝකතන ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීම හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම, සමස්ථ අයවැය ප්‍රතිපාදන කළමනාකරණය කිරීම හා විවිධ ව්‍යාපෘති ඇතුළු අනෙකුත් ආයතන වෙත සැලසුම්ගතව අක්මුදල් නිදහස් කිරීම, විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් මූල්‍ය පාලනය, වාර්ෂික විසර්ජන ගිණුම, අත්තිකාරම් ගිණුම, තැන්පත් ගිණුම් හා ව්‍යාපෘතිවල අවසන් ගිණුම් ඉදිරිපත් කිරීම, අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති විසින් යොමු කරන විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීම, වාර්ෂික ගබඩා සමීක්ෂණ කටයුතු සිදු කිරීම.

## විසර්ජන ගිණුම 2016

ශීර්ෂය 120 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2016 වර්ෂය සඳහා වූ 2016.12.09 දිනැති අංක 252/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ඩීජීඑස්ඒ 1 ආකෘතියේ සිට 10 ආකෘතියද, සටහන (i) සිට සටහන (iv) (අ) හා (ආ) දක්වා වූ තොරතුරු සාරාංශයකින් සමන්විතව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට, 2016 අංක 24 දරන හා 2016 අංක 23 දරන විසර්ජන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත 2014 අංක 47 දරන විසර්ජන පනත හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, 2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඇතුලත් රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව විසර්ජන ගිණුම සකස්කර නියමිත දිනට ඉදිරිපත් කර ඇත.

## 2016 වර්ෂයේ මුල්‍ය ප්‍රගතිය

| වැඩ සට හන් අංකය | වැඩ සටහනේ නම | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ.66 සහ 69 අනුව මාරු කිරීම් | ශුද්ධ වෙන් කිරීම් | මුළු වියදම |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| | පුනරාවර්තන | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 625,130,000 | 1,500,000 | 3,235,000 | 629,865,000 | 551,373,284 |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 8,048,355,000 | 133,900,000 | 3,235,000 | 8,179,020,000 | 6,381,362,338 |
| | උප එකතුව (පුනරාවර්තන) | 8,673,485,000 | 135,400,000 | 0 | 8,808,885,000 | 6,932,735,622 |
| | මූලධන | | | | | |
| 1 | මෙහෙයුම් ක්‍රියාකාරකම් | 73,300,000 | 109,213,315 | | 182,513,315 | 128,532,064 |
| 2 | සංවර්ධන ක්‍රියාකාරකම් | 711,310,000 | 198,896,812 | | 910,206,812 | 406,829,532 |
| | උප එකතුව (මූලධන) | 784,610,000 | 308,110,127 | 0 | 1,092,720,127 | 535,361,596 |
| | මුළු එකතුව | 9,458,095,000 | 443,510,127 | 0 | 9,901,605,127 | 7,468,097,218 |

## වියදම් මුල්‍යකරණය

| | | වැඩ සටහන 1 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය |
| | | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 812,378,315 | 679,905,348 | 812,378,315 | 679,905,348 | 84 |
| | එකතුව | 812,378,315 | 679,905,348 | 812,378,315 | 679,905,348 | 84 |

| | | වැඩ සටහන 1 හා 2 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය |
| | | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 8,501,270,000 | 6,660,120,389 | 8,501,270,000 | 6,660,120,389 | 78 |
| 12 | විදේශ ණය | 473,500,000 | 6,185,523,569 | 473,500,000 | 6,185,523,569 | 24 |
| 13 | විදේශ ආධාර-ප්‍රධාන | 112,456,812 | 39,644,194 | 112,456,812 | 39,644,194 | 35 |
| | එකතුව | 9,087,226,812 | 12,885,288,152 | 9,087,226,812 | 12,885,288,152 | 78 |

## රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී"ගිණුම

| විස්තරය | උපරිම වියදම් සීමාව රු. | අවම ලැබීම් සීමාව රු. | උපරිම හර ශේෂ සීමාව රු. |
|---|---|---|---|
| විසර්ජන පනත මඟින් බලය දෙනු ලැබූ සීමාවන් | 30,000,000.00 | 18,000,000.00 | 85,000,000.00 |

## අභ්‍යන්තර විගණන අංශය

### ප්‍රධාන කාර්යභාරය

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල මුදල් හා ආයතන කටයුතු විගණනය හා වාර්තා කිරීම.
- වැරදි හා වංචා වැළැක්වීම සඳහා අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වන පාලන ක්‍රම, සාර්ථක දැයි සොයා බැලීම හා ඒ පිළිබඳ නිරීක්ෂණ හා යෝජනා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශයේ ගිණුම් හා වෙනත් වාර්තාවල විශ්වාසනීයත්වය විනිශ්චය කිරීම හා අමාත්‍යාංශයේ වත්කම් සියලුම ආකාරයේ අලාභහානි වලින් උපරිම වශයෙන් ආරක්ෂා කර ඇත්දැයි යන්න සොයා බැලීම හා වාර්තා කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති අංශවල පහත සඳහන් කටයුතු සම්බන්ධව ප්‍රගති සමාලෝචනය කිරීම සඳහා මාස තුනකට (03) වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

    - වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචනය කිරීම හා දුර්වල කාර්ය සාධනයන් මගහරවා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ඉදිරිපත් කිරීම.
    - විගණකාධිපති විසින් නිකුත් කරන විගණන විමසුම්/විගණන වාර්තා සඳහා පිළිතුරු සැපයීම.
    - වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ ඉදිරිපත් කිරීම්
    - වාර්ෂික වාර්තා/කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
    - වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම පිළිබඳ විගණනය
    - සංවර්ධන හා අභ්‍යන්තර පරිපාලනය කටයුතු

- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු සිදුවීම ප්‍රමාදවීමට තුඩු දී ඇති ගැටළු විගණනය කිරීම හා වාර්තා කිරීම.

2016 වර්ෂයට අදාළව කළමනාකරණ හා විගණන කමිටු, පළමුවන කාර්තුවට 2016.04.28 දින ද, දෙවන කාර්තුවට 2016.07.22 දිනද, තුන්වන කාර්තුවට 2016.10.17 දිනද, සිව්වන කාර්තුවට 2016.12.27 දිනද පවත්වා ඇත.

| 2016 වර්ෂය තුළ සිදුකල විගණන විමසුම් පිළිබඳ විස්තර | | |
|---|---|---|
| 01. | 2015 ඔක්තෝම්බර් මස ගෙවීම් වවුචර් පරීක්ෂාව | 2016.01.13 |
| 02. | සුව දිවියට පෝෂණ වැඩසටහන - 2015 | 2016.01.22 |
| 03. | බියගම වනිතා ශක්ති පදනම් පරීක්ෂා කිරීම - 2015 | 2016.01.22 |
| 04. | ගර්භණී මාතාවන්ට රු 20,000/- ක් වටිනා පෝෂණදායී ආහාර ලබාදීම | 2016.01.24 |
| 05. | 2015 නොවැම්බර් මස ගෙවීම් වවුචර් පරීක්ෂාව | 2016.02.08 |
| 06. | අභ්‍යන්තර විගණන පරීක්ෂාව - බැංකු සැසඳුම් ප්‍රකාශ, 2016 ජනවාරි | 2016.02.29 |
| 07. | 2015 දෙසැම්බර් මස ගෙවීම් වවුචර් පරීක්ෂාව | 2016.03.29 |
| 08. | කන්තලේ වනිතා ශක්ති පදනමේ ගිණුම් විගණනය | 2016.03.29 |
| 09. | ජාතික කාන්තා කමිටුව විසින් 2015 වර්ෂය තුල සිදු කල පර්යේෂණ පිළිබඳ විගණන විමසුම | 2016.04.01 |
| 10. | කාන්තා සෙවණ නේවාසිකාගාරය - බියගම | 2016.04.05 |
| 11. | අභ්‍යන්තර විගණන පරීක්ෂාව - බැංකු සැසඳුම් ප්‍රකාශ, 2016 පෙබරවාරි | 2016.04.05 |
| 12. | නිවාඩු ගමන් බලපත්‍ර (රාජ්‍ය සේවකයන් සඳහා දුම්රිය නිවාඩු ගමන් බලපත්‍ර නිකුත් කිරීම) 2015 | 2016.04.05 |
| 13. | ජාතික ළමා සංවර්ධන අරමුදල | 2016.05.23 |
| 14. | ළමා ලේකම් කාර්යාලය සඳහා වෙබ් පිටුවක් නිර්මාණය කිරීම | 2016.05.24 |
| 15. | අභ්‍යන්තර විගණන පරීක්ෂාව - බැංකු සැසඳුම් ප්‍රකාශ, 2016 අප්‍රේල් | 2016.05.27 |
| 16. | බැංකු සැසඳුම් වාර්තා 2016 - පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 2016.06.16 |
| 17. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම් පරීක්ෂාව - 2015 | 2016.06.16 |
| 18. | 2015 වර්ෂයේ වැටුප් ලේඛණය අනුව ගෙවීම් නතරකර ඇති නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු පිළිබඳ පරීක්ෂාව | 2016.06.29 |
| 19. | 2015 වර්ෂයේ වැටුප් ලේඛණය අනුව ගෙවීම් නතරකර ඇති නිලධාරීන් පිළිබඳ පරීක්ෂාව | 2016.06.29 |
| 20. | අත්තිකාරම් නොපියවීම | 2016.07.27 |
| 21. | අභ්‍යන්තර විගණන පරීක්ෂාව - බැංකු සැසඳුම් ප්‍රකාශ, 2016 ජූනි | 2016.07.27 |
| 22. | පරත්ත ළමා නේවාසිකාගාරය - පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 2016.08.01 |
| 23. | 2015 දෙසැම්බර් මස ගෙවීම් වවුචර් පරීක්ෂාව - පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 2016.08.15 |
| 24. | කැපකරු දෙගුරු ශිෂ්‍යාධාර වැඩසටහන 2016 - ප්‍රගති සමාලෝචනය | 2016.09.02 |
| 25. | මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ පරීක්ෂාව | 2016.10.19 |
| 26. | අපේක්ෂා ණය අරමුදල - කුරුණෑගල දිස්ත්‍රික්කය | 2016.11.07 |
| 27. | චක්‍රීය ණය අරමුදල - කළුතර දිස්ත්‍රික්කය | 2016.11.10 |
| 28. | මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ පරීක්ෂාව - ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2016.11.23 |
| 29. | පරිකල්පන චිත්‍ර තරඟය- 2016 | 2016.11.28 |

## සැලසුම් අංශය

### ප්‍රධාන කාර්යභාරය

01. අමාත්‍යාංශයේ සියලු අංශ සහ දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කර ගනිමින් ඉදිරි සැලසුම් සකස් කිරීම.
02. අමාත්‍යාංශයේ සියලු අංශ සහ දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කර ප්‍රගති වාර්තා සකස් කිරීම.
03. සැලසුම් අංශයට අදාළ මාධ්‍ය කටයුතු මාධ්‍ය අංශය හා එක්ව සිදු කිරීම, තොරතුරු බෙදා හැරීම හා සම්බන්ධීකරණය.
04. රාජ්‍ය නොවන සංවිධාන සමඟ පවත්වන වැඩ සටහන් සම්බන්ධීකරණය හා ප්‍රගති වාර්තාකරණය
05. අමාත්‍යාංශය නියෝජනය කරමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් හා දැනුවත් කිරීමේ වැඩ සටහන් වශයෙන් පවත්වන විවිධ උත්සව අවස්ථා සංවිධානය හා සාර්ථකව පැවැත්වීම.
06. විවිධ සමාජ සත්කාරක සේවාවන් සඳහා දායකත්වය ලබා දීම.
07. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩ සටහන් මෙහෙයුම් හා පසු විපරම් කිරීම (ජාතික/දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමේ කාන්තා හා ළමා සංවර්ධන වැඩ සටහන්)
08. සැලසුම් අංශයට අදාළ මූලික විෂයානුබද්ධ තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම.
09. පර්යේෂණ ආයතන වෙත ප්‍රගති වාර්තා හා සැලසුම් ලබා ගැනීම.

### 2016 වර්ෂයේ ක්‍රියාත්මක වැඩ සටහන්

- 2016 වර්ෂය සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළ අතර, එය පාදක කර ගනිමින් දිස්ත්‍රික් ඒකාබද්ධ සැලසුම් 25ක්ද සකසන ලදී. එකී සැලසුම් පිළිබඳව සියළු දිස්ත්‍රික්කවල අමාත්‍යාංශය මගින් අනුයුක්ත කර සිටින ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කර දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කරන ලදී.

- ශ්‍රී ලාංකීය දරුවන්ගේ අයිතීන් හා රැකවරණය තහවුරු කිරීමේ අරමුණින් ජාතික හා ජාත්‍යන්තර එකඟතාවන්ට අනුකූලව ජාතික හා පළාත් මට්ටමින් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට ළමයින් සඳහා වන පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම (2016-2020) සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.
- අතිගරු ජනාධිපතිතුමන්ගේ මගපෙන්වීම මත "දරුවන් සුරකිමු" නමින් විශේෂ ජාතික වැඩසටහනක් ආරම්භ කර ඇති අතර, එමගින් කෙටිකාලීන හා දීර්ඝකාලීන වශයෙන් ශ්‍රී ලංකාවේ ළමයින්ට සුරක්ෂිත සමාජයක් නිර්මාණය කිරීම අරමුණු කෙරේ. දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන අනෙකුත් අමාත්‍යාංශ හා ආයතනද ඒකාබද්ධව 2016 -2018 කාලය තුළ ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන තුළින් ළමා අයිතිවාසිකම් ආරක්ෂා වන වටපිටාවක් නිර්මාණය කිරීමට අපේක්ෂිතය.
- ශ්‍රී ලංකාව පුරා බහුලව සිදුවන ළමා අපයෝජන සිද්ධීන්වලට හේතුවන කරුණු සොයා බැලීමට හා ඒවාට විසඳුම් ලබාදීමේ අරමුණින් ළමා අපයෝජන වැළැක්වීම පිළිබඳ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (2016 -2018) ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියද මේ වන විට ලැබී ඇති අතර ත්‍රෛමාසිකව ප්‍රගතිය අධීක්ෂණය කෙරේ.

02. ප්‍රගති සමාලෝචනය

මෙම අමාත්‍යාංශය වෙත වාර්ෂිකව වෙන් කරනු ලබන සීමිත මුදල් ප්‍රතිපාදන / අරමුදල් ඵලදායීව හා උපරිම වශයෙන් භාවිතයට ගැනීම සාක්ෂාත් කර ගැනීම සඳහා අඛණ්ඩව ප්‍රගති සමාලෝචනය සිදු කළ යුතුවේ.

ඒ අනුව 2016 වසර සඳහා පහත පරිදි ප්‍රගති සමාලෝචනය සිදුවිය.

1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2016 පළමු, දෙවන හා තෙවන කාර්තු ප්‍රගති වාර්ථා පිලියෙල කිරීම.

2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්තු ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා සියළු අංශ ප්‍රධානීන් සමඟ රැස්වීම් 02ක් පැවැත්වීම.

3. 2016 පළමු, දෙවන හා තෙවන කාර්තු ප්‍රගතියට අදාල online ප්‍රගති වාර්ථා 03ක් සකස් කිරීම.

4. රජයේ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කාර්තු ප්‍රගති වාර්ථා සැකසීම.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය දිවයින පුරා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් තුළින් උපරිම ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් ප්‍රතිලාභීන් වෙත ලබාදීම සාක්ෂාත් කරනු වස් 2016 වර්ෂයේ සිට අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් ඍජුවම එක් එක් දිස්ත්‍රික්කය සම්බන්ධව වගකීම දරණ පරිදි විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

දිස්ත්‍රික්ක 25 සඳහාම එක් එක් දිස්ත්‍රික්කය සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ මාණ්ඩලික නිලධාරියෙකු පත්කර ඇති අතර, අවම වශයෙන් වසරක් තුළ දෙවරක්වත් අදාල දිස්ත්‍රික්කයේ ප්‍රගති සමාලෝචනය සිදු කර වාර්ථාවක් ඉදිරිපත් කළ යුතු වේ. මේ වැඩසටහන ඉතා සාර්ථකව මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර, තවදුරටත් මෙම ක්‍රියාවලිය ශක්තිමත් කරණු පිණිස දිස්ත්‍රික්ක 25හිම දිස්ත්‍රික් ක්ෂේත්‍ර නිලධාරීන් සියළු දෙනා හට ප්‍රගති සමාලෝචන හා ධාරිතා සංවර්ධන දෙදින වැඩසටහනක් කොළඹදී පැවැත්විණි. ඒ තුළින් සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය විමර්ෂණය කළ අතර, ක්රියාත්මක කිරීමේදී පැන නඟින ගැටළු/ අවශ්‍යතා හඳුනා ගනිමින් ඒවා මඟහරවා ගැනීම සඳහා උපදෙස් ලබා දෙන ලදී.




තලාහේන ප්‍රගති සමාලෝචන රැස්වීමේ විශේෂ අවස්ථා

## සංවර්ධන අංශය

### ප්‍රධාන කාර්යභාරය

අමාත්‍යාංශයීය දැක්ම යථාර්තයක් කර ගැනීමේ අභිලාෂය සාක්ෂාත් කිරීම උදෙසා අමාත්‍යාංශයේ සියලු ආයතන හා අංශ මෙන්ම, එක්සත් ජාතීන්ගේ අනුග්‍රාහක ආයතන ඇතුළු අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන වලට අදාල ව්‍යාපෘති මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩ සටහන් වලට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, වැඩ සටහන් සම්බන්ධීකරණය කරමින් ජාතික මට්ටමේ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

### ක්‍රියාවට නංවන ලද වැඩ සටහන් හා ප්‍රගතිය

- 2016 වර්ෂයේ දී දිරිය කාන්තා වැඩ සටහන යටතේ රු. 50,000,000.00 ප්‍රතිපාදන වෙන් වූ අතර වසර අවසානයේ දී මුල්‍ය ප්‍රගතිය රු.33,702,478.03 විය. ඒ අනුව 67% මුල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.
- 2016 වර්ෂයේ දී ළමා අපයෝජනය හා කාන්තා හිංසනය වැළැක්වීමේ වැඩ සටහන යටතේ රු. 66,376,000.00 ප්‍රතිපාදන වෙන් වූ අතර, වසර අවසානයේ දී මුල්‍ය ප්‍රගතිය රු.37,581,499.86 විය. ඒ අනුව 75% මුල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.
- 2016 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල යටතේ රු.6,500,000.00 ප්‍රතිපාදන වෙන් වූ අතර, වසර අවසානයේ දී මුල්‍ය ප්‍රගතිය රු.690,313.00 විය.
- 2016 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල යටතේ රු 12,906,812.00 වෙන් වූ අතර වසර අවසන් වන විට මුල්‍ය ප්‍රගතිය රු.11,415,307.00 වි ඇත.

### ඉහත වැඩ සටහන් යටතේ ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘතීන්

- **ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි ළමා හා කාන්තා සංවර්ධන ඒකක පිහිටුවීම**

ළමා හා කාන්තා සංවර්ධනය සඳහා වන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා මෙම ඒකක ප්‍රාදේශිය ලේකම් කාර්යාල තුළ ස්ථාපිත කිරීමේ කාර්යය 2016 වර්ෂයේදී ද සිදු කරන ලදී. ළමුන් හා කාන්තාවන් පිළිබඳ රජය විසින් ක්‍රියාත්මක කරන වැඩ සටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ දී මනා සම්බන්ධීකරණයකින් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සමීප අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ ළමා හා කාන්තා විෂයට අදාළ කටයුතු ඒකාබද්ධ කිරීමෙන් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් ඇති කිරීම මෙයින් අපේක්ෂා කරමින් මෙම වර්ෂයේදී රු.මි. 6.245 ක් වැය කර ඇත.

### ➢ මාධ්‍ය හරහා දැනුවත් කිරීමේ වැඩ සටහන් දියත් කිරීම

ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ කාන්තා ප්‍රතිරූපය යහපත් අයුරින් ගොඩනැගීම උදෙසා තීරණාත්මක බලපෑම් ඇති කිරීමට මාධ්‍ය විවිධ පරාසයන් හි සිය කාර්ය භාරය ඉටුකරනු ලබයි. ස්ත්‍රි පුරුෂ සමාජභාවය, සමානාත්මතාවය තහවුරු කිරීම හා දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය වැඩි කිරීම, කාන්තාවන්ට සිදු වන විවිධාකාරයේ හිංසන, සැහැසි ක්‍රියා තුරන් කිරීම සහ බාල වයස් දැරියන් අඩු වයස් ගැබ් ගැනීම් තුරන් කිරීම උදෙසා වැඩ සටහන් හා කෙටි චිත්‍රපට නිෂ්පාදනය කිරීම හා අත්පත්‍රිකා නිර්මාණය කිරීම මේ යටතේ සිදු කර ඇත. ඒ සඳහා 2016 වර්ෂයේ රු. මි.1.325 වැය කර ඇත.

### ➢ තොරතුරු තාක්ෂණ ඒකකය හා කාන්තා දත්ත පද්ධතිය

කාන්තා දත්ත පද්ධතියට අවශ්‍ය තොරතුරු හා සංවර්ධන වැඩ සටහන් වල ප්‍රගතිය ප්‍රාදේශීය මට්ටම තුළදීම පරිගණකයට ඇතුලත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින ක්ෂේත්‍ර නිලධාරීන් පරිගණක පිළිබඳව විධිමත්ව පුහුණු කිරීම හා ඊට අයත් කාර්යයන් සඳහා ද ඒ සම්බන්ධයෙන් වන අනෙකුත් කාර්යයන් සඳහා 2016 වර්ෂයේ රු.මි.3.716 වැය කර ඇත.

### ➢ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පරිගණක පුහුණුව ලබාදීම

දත්ත පද්ධතිය සඳහා ඇතුලත්ව පවතින තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම සිටින වනිතා සංවර්ධන නිලධාරීන් මඟින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා ඔවුනට අවශ්‍ය පරිගණක යන්ත්‍ර ඇතුළු කාර්යාල උපකරණ ද, එම දත්ත පරිගණක ගත කිරීම සඳහා අවශ්‍ය පරිගණක පුහුණුව ද දිස්ත්‍රික් මට්ටමින් අමාත්‍යාංශය විසින් ලබා දී ඇත.

### ➢ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූල ප්‍රවාහකරණය හා කාන්තා අයිතිවාසිකම් පිළිබඳව සමාජය සංවේදී කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මූල ප්‍රවාහකරණය හා කාන්තාවන්ට සිදුවන හිංසන ක්‍රියාවන් හේතුවෙන් කාන්තාවන් පත්ව ඇති පීඩාවන්ගෙන් ඇයව මුදවාලීමත්, ඇය කෙරෙහි ඇති විවිධ දුර්මතයන් හා නොසලකා හැරීම් පිළිබඳව සමාජය සංවේදී කිරීමේ අරමුණින් මෙම වැඩසටහන පැවැත්වේ. දැනුවත් කිරීමේ වැඩසටහන්, දේශණ හා වැඩමුළු සහ සංගීතමය වැඩසටහන් තුළින් මෙම වැඩසටහනේ අරමුණ සමාජගත කිරීමට කටයුතු කර ඇත.

## ➢ පාරිසරික සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා කාන්තාවන් දිරිගැන්වීම

කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන් යටතේ පාරිසරික හා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයෙහි කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම උදෙසා පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය සමඟ සම්බන්ධ වූ ග්‍රාමීය කාන්තාවන්ගේ ආදායම වර්ධනය කිරීම සහ ඔවුන් රැකියාවන් වෙත යොමු කිරීමටත්, දේශීය අමුද්‍රව්‍ය යොදා නිෂ්පාදනය කරන නිමැවුම්, දේශීය ඖෂධ, දේශීය සංස්කෘතිකාංග ඔප්නැංවීම, කාබනික පොහොර යොදා ගෙන කරනු ලබන බෝග නිෂ්පාදනය ප්‍රවලිත කිරීම මඟින් ආදායම් උත්පාදන වැඩසටහන් මෙමගින් දියත් කෙරේ. මෙමගින් ඉතා අඩු ආදායම් මට්ටමක ජීවත්වන කාන්තාවන්ගේ නිෂ්පාදන ප්‍රවලිත කිරීමත්, ශ්‍රම සූරාකෑම, කාන්තා හිංසනය වැනි සංචාරක කර්මාන්තය හා සම්බන්ධව පැන නගින ගැටළු වලක්වා ගැනීම උදෙසා ද මෙම නව ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කෙරේ. දැනට නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර පූජා භූමිය කේන්ද්‍ර කරගනිමින් මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ආරම්භ කරන ලදී.

## ➢ කාන්තාවන්ට හිතකාමී හා උපකාරී ආදර්ශ ගම්මාන වැඩසටහන

මේ යටතේ මහවිලච්චිය, වැලිකන්ද, රිදීමාලියද්ද, යටවත්ත හා කෝරළෙයිපත්තු දකුණ (කිරාන්) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි තෝරාගන්නා ලද ගම්මාන 5 ක් ආදර්ශ ගම්මාන ලෙස සංවර්ධනය කරන ලදී.

## ➢ කාන්තා රැකවරණ මධ්‍යස්ථාන ඉදි කිරීම

යාපනය දිස්ත්‍රික්කයේ මරදන්කර්නි, මුලතිවු දිස්ත්‍රික්කයේ මැරටයිම්පත්තු, මඩකලපු දිස්ත්‍රික්කයේ මන්මුනේ උතුර, රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුවගමහි පිහිටි කොලින්ස් ක්‍රසන්ට් රජයේ නිල නිවාසය යන ස්ථානයන් හි ඉදිකරන ලද මධ්‍යස්ථානයන්හි ඉතිරි වැඩ කටයුතු නිම කරන ලදි.

## ➢ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ස්ථාපිත කිරීම

ළමා අපයෝජනය හා කාන්තා හිංසන වැළැක්වීම සඳහා පොලීසිය මඟින් ඉටු කරන කාර්ය භාරය ශක්තිමත් කිරීම සඳහා 2014 වර්ෂයේ දී පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදී. එම විශේෂ ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු මෙම වසරේ දී නිම කරන ලදී.

## ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

### දැක්ම

ශ්‍රී ලාංකීය ජනසමාජය උදෙසා තීක්ෂණ, සංවේදී හා විශ්වාසයෙන් යුතු කාන්තා පරපුරක් නිර්මාණය කරන ජාතික ආයතනය බවට පත් කිරීම.

### මෙහෙවර

සිය බුද්ධියද ශක්තියද උපරිම හා යහපත් ලෙස භාවිතා කරමින් ස්වශක්තියෙන් අභියෝගයන්ට මුහුණ දෙන ශ්‍රී ලාංකීය කාන්තා පරපුරක් සඳහා උචිත පරිසරයක් නිර්මාණය කිරීමට විධිමත් සංවිධාන රාමුවක් ඔස්සේ සැලසුම් සහගත වූ දැනුවත් බව ලබා දෙමින් සිදු කෙරෙන සමාජීය හා ආර්ථික බල ගැන්වීම මඟින් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව කාන්තා අභිවෘද්ධිය උදෙසා ක්‍රියාත්මක වන ජාතික යාන්ත්‍රණය බවට පත්වීම.

## අරමුණු

- ආර්ථික, සමාජයීය, අධ්‍යාපනික, දේශපාලනික හා සංස්කෘතික ආදී ක්ෂේත්‍රයන් තුළ ශ්‍රී ලාංකීය කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් භුක්ති විදීමට අවස්ථාව සලසා දීම.
- කාන්තාවන් වූ නිසාම නොයෙකුත් ක්ෂේත්‍ර තුළ දැනට අත්විදින බාධා ඉවත් කිරීම සඳහා ඔවුන් සවිබල ගැන්වීම.
- කාන්තාවන්ට සම අයිතිවාසිකම් හා සම අවස්ථා තහවුරු විය යුතු අංශ හඳුනා ගැනීම, ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමට සහය දීම සහ ඒ සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන කාර්යභාරය

- ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික වශයෙන්ද, සමාජීය වශයෙන්ද බල ගැන්වීම සඳහා සුදුසු වැඩ සටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම.
- සියලුම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂිතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ත සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තාවන්වීම නිසාම ඔවුන් මුහුණදෙන සමාජීය දුෂ්කරතා මඟ හැරවීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- සමාජයේ විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණදෙන කාන්තාවන් අරභයා විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- සමස්ත කාන්තා පරපුරේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ තලයකට නංවාලීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තාවන්ට එකම සංවිධානය තුළ ක්‍රියාත්මක වීම සඳහා (Smooth Functioning) ප්‍රජා මූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධාන ගත කිරීම.

# වැඩ සටහන් ව්‍යුහය

## ආර්ථික වශයෙන් බලගැන්විමේ වැඩසටහන්

- වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම
- පශු සම්පත් වැඩසටහන
- ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ වැඩසටහන
- ශිල්පීය පුහුණු වැඩසටහන
- කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවිපොළ
- චක්‍රීය ණය වැඩසටහන
- වනිතා ශක්ති පදනම
- විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් මෙරට තුලදී ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම
- "දිරිය දැතට සවිය "ධීවර කාන්තාවන් සවිබල ගැන්වීම

## සමාජීය වශයෙන් බලගැන්වීම්

- කාන්තා රැකවරණ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම
- උපදේශන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම සඳහා ප්‍රජාව දැනුවත් කිරිම
- "සුව දිවියට පෝෂණය" නමින් වූ පෝෂණ වැඩ සටහන
- වතුකරයේ කාන්තාවන් සඳහා මූල්‍ය කළමනාකරණ වැඩ සටහන
- නව යෞවනියන්ගේ ජීවන කුසලතා හා ප්‍රජනන සෞඛ්‍ය වැඩ සටහන
- කාන්තා සංවිධාන ජාලය ශක්තිමත් කිරීම
- බන්ධනාගාරගත කාන්තාවන් සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ වැඩ සටහන්
- ජාත්‍යන්තර කාන්තා දිනයට හා ගැහැණු දරුවාගේ දිනයට සමගාමී වැඩ සටහන්

## වෙනත් වැඩසටහන්

- දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කටයුතු
- නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩ සටහන්
- මාධ්‍ය ප්‍රචාරණය හා පුස්තකාලය පවත්වාගෙන යාම

## ක්‍රියාවට නංවන ලද වැඩ සටහන් හා ප්‍රගතිය

මෙම වර්ෂයේ දී කාන්තා සවිය වැඩ සටහන යටතේ රු.35,000,000 අයවැය ඇස්තමේන්තු වෙන් වූ අතර වසර අවසානයේ දී මූල්‍ය ප්‍රගතිය රු. 34,306,539.79 විය. ඒ අනුව 98% මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

### ආර්ථික වශයෙන් බලගැන්වීමේ වැඩ සටහන්

- **වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම.**

ශ්‍රී ලාංකීය ජන සමාජයේ වැන්දඹු වූ හා රැකියා විරහිතව සිටින කාන්තාවන්, ගෘහමූලික කාන්තාවන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමත්, ඔවුන්ගේ සමාජයීය තත්ත්වයන් ගොඩනංවාගැනීමටත් හැකිවන පරිදි මෙම වැඩ සටහන සැලසුම් කර ඇත. මේ යටතේ 2016 වර්ෂය තුළදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 25 ක් තුල සෘජු ප්‍රතිලාභ වශයෙන් කාන්තාවන් 221 ක් දෙනෙකුට ස්වයංරැකියා ආධාර හා ණය වශයෙන් රු. මි. 5.0222 ප්‍රදානය කර ඇත.

- **පශු සම්පත් වැඩසටහන**

දියර කිරි පරිභෝජනය තුලින් පවුල් පෝෂණය, ඓන්ද්‍රීය අපද්‍රව්‍ය තුලින් කාබනික පොහොර නිෂ්පාදනය හා ගෙවතු වගා කටයුතු දිරිමත් කිරීම, ජීව වායු නිෂ්පාදනය, අතුරු ආදායම් මාර්ග තුලින් ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා දේශීය කිරි අවශ්‍යතාවය 55% දක්වා දේශීයව උපයා ගැනීම හා කිරි වීදුරුව වැඩසටහනට සාධනීය දායකත්වයක් ඇති කරලීම සඳහා මෙම වැඩ සටහන සැලසුම් කර ඇති අතර, කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන් උදෙසා ක්‍රියාත්මක වේ. මෙහිදී මූලිකවම ප්‍රතිලාභීන්ට සත්ව පාලනය පිළිබඳව පුහුණු වීමක් ලබා දෙන අතර, පුහුණුවෙන් පසු කිරි දෙනුන් ලබා ගැනීමට චක්‍රීයව ක්‍රියාත්මක වන පරිදි රු. 40,000 ක උපරිම ණය මුදලක් ලබා දෙනු ලැබේ. ඒ අනුව 2016 වර්ෂයේ පුහුණු වැඩසටහන් 14 ක් ප්‍රතිලාභීන් 150 දෙනෙකු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 7 ක ක්‍රියාත්මක කර ඇත. කිරි ගවයින් මිලදී ගැනීමට හා පුහුණු වැඩසටහන් සඳහා රු. මි. 1.9975 ක් වැය කර ඇත.

- **ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ පුහුණු වැඩ සටහන (ව්‍යවසායක සංවර්ධන පුහුණු)**

ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය කළමනාකරණ ව්‍යවසායක හා ගිණුම් කටයුතු පිළිබඳව දැනුම ලබා දීම හා ව්‍යාපාර ගැන්වීමට පෙළඹවීම මෙමගින් සිදු කරනු ලබයි. මෙහිදී ජාතික ශිල්ප සභාව, ලක්සල, හස්ත කර්මාන්ත, අත්කම් නිර්මාන, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, විද්‍යාතා පුහුණු මධ්‍යස්ථාන, රෙජ කර්මාන්ත අමාත්‍යාංශය යන ආයතනවල ප්‍රවීන පුහුණු කරුවන් විසින් පුහුණු වීම් ලබා දීමත්, නිෂ්පාදන අමුද්‍රව්‍ය පහසුකම් සැලසීම හා අලෙවිය සඳහා වෙළඳපොල අවස්ථා හඳුන්වාදීමටත් හැකි වන පරිදි මෙම වැඩ සටහන සැලසුම් කර ඇත. 2016 වර්ෂයේ දී ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙළඹවීමේ වැඩ සටහන් 89 ක් ප්‍රතිලාභීන් 4580 ක් සඳහා ද, ශිල්පීය පුහුණු වැඩ සටහන් 20 ක් ප්‍රතිලාභීන් 428 ක් සඳහාද

අලෙවිපොළ අවස්ථා වැඩි කිරීම අරමුණු කොට අලෙවි ප්‍රදර්ශන වැඩ සටහන් 24 ක් ප්‍රතිලාභීන් 1530 ක් සම්බන්ධ කරමින් සිදු කරන ලදී. මෙම වැඩසටහන් සඳහා 2016 වර්ෂය තුලදී රු.මිලියන 4.9716 ක් වැය කර ඇත.

- **චක්‍රීය ණය වැඩ සටහන හා ගිණුම් පුහුණුව**

ආයෝජන සඳහා යෙදවුම් ප්‍රමාණය ඉහල නැංවීම සඳහා කාන්තා කාර්ය සංවිධානවල ලියාපදිංචි සාමාජිකාවන් වෙත මෙම ණය ක්‍රමය ක්‍රියාත්මක වේ. 2016 වර්ෂයේ දී රු.මිලියන 0.44794 වැය කර ඇත. චක්‍රීය ණය වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී ගිණුම් තබාගත යුතු ක්‍රම වේදයන් පිළිබඳව කාන්තාවන් සහ අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනුයුක්ත කර ඇති නිලධාරීන් පුහුණු කිරීම 2016 වසරේදී ද සිදු කර ඇත. වැඩසටහන් 12 ක ප්‍රතිලාභීන් 827 දෙනෙකු වෙත ලබා දී ඇති අතර, ඒ සඳහා රු. මි. 2273 ක් වැය කර ඇත.

- **විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් මෙරට තුළදී ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම**

විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් විදේශගතවීම නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵල හා විදේශගතවීම වෙනුවට දේශීය වශයෙන් රැකියා අවස්ථා හඳුන්වා දීම සහ ඊට කාන්තාවන් උනන්දුකර වීම සඳහා මේ යටතේ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. 2016 වර්ෂයේ දී රු.මි.2.3458 ක් වැය කර ඇති අතර, වැඩ සටහන් 83 ක් පවත්වා ඇත.

- **"දිරිය දැතට සවිය" ධීවර කාන්තාවන් සවිබල ගැන්වීම**

ධීවර ප්‍රජාවන්හි කාන්තා කාර්ය සංවිධාන සාමාජිකාවන්ගේ ආර්ථිකය නංවාලීම සඳහා "දිරිය දැතට සවිය" ධීවර කාන්තා වැඩ සටහන යටතේ ධීවර කර්මාන්තයට අවශ්‍ය උපකරණ හා දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදන බිහි කිරීම හා ඒ සඳහා උනන්දුවක් ඇති කිරීම තුළින් ධීවර කාන්තාවන් ස්වයං රැකියා ගැන්වීම මෙම වැඩසටහනේ අරමුණ වන අතර, මේ සඳහා 2016 වර්ෂයේ රු. මි. 2 ක් වැය කර ඇත.

**සාමාජීය වශයෙන් බලගැන්වීමේ වැඩ සටහන්**

ශ්‍රී ලාංකේය කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන් වෙත ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම මෙහිදී සිදු කරනු ලබයි. මේ යටතේ,

- **රැකවරණ මධ්‍යස්ථාන**

නීති විරෝධී මිනිස් වෙළඳාමට හසු වූ දේශීය හා විදේශීය කාන්තා වින්දිතයින් හා ඔවුන්ගේ දරුවන් අදාළ ගැටළුව විසඳෙන තෙක් ආරක්ෂිතව රඳවා තැබීම හා ඔවුනට රැකවරණය සැලසීම, උපදේශනය, නීතිමය කටයුතු සඳහා පහසුකම් සැලසීම, සෞඛ්‍ය පහසුකම් හා ඔවුන්ගේ මූලික

අවශ්‍යතා සැපයීම (ආහාර, ඇඳුම්) මෙම මධ්‍යස්ථාන වලින් ඉටුවන කාර්යයන් වේ. මෙම රැකවරණ මධ්‍යස්ථාන 02 පවත්වාගෙන යාම වෙනුවෙන් රු .මි.1.6315 වැය කර ඇත.

## ➢ උපදේශන වැඩ සටහන් හා උපදේශන මධ්‍යස්ථාන

පීඩාවට පත් වූ කාන්තාවන්ට හා ළමුන්ට මනෝ විද්‍යාත්මක උපදේශන ලබා දෙමින් ඔවුනට සේවා ලබා ගත හැකි පුද්ගයින් හා ආයතන වෙත යොමු කිරීමත්, ජීවිතයේ පැන නගින ගැටළු විසදා ගැනීමේ දී මනෝ විද්‍යාත්මක ක්‍රම භාවිතයට හුරු කිරීම අරභයා උපදේශන මධ්‍යස්ථාන 12 ක් උපදේශන නිලධාරීන් යටතේ පවත්වාගෙන යන අතර, ඊට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා උපදේශන සහකාර නිලධාරීන් අනුයුක්ත කර ඇත. එමඟින් සමාජීය ගැටළු සඳහා විසඳුම් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබයි. 2016 වර්ෂය තුළ දී පුද්ගලයින් 172 දෙදෙනකු සඳහා මනෝඋපදේශන මගපෙන්වීම් සිදුකර ඇත. මේ සඳහා රු.මි. 1.0695 ක් වැය කර ඇත.

## ➢ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන හා තැනැත්තන් වෙළදාම වැළැක්වීමේ වැඩ සටහන

කාන්තාවන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්තීන් හා සම්මුතීන් පිළිබඳවත්, කාන්තා අයිතිවාසිකම් හා ස්ත්‍රී පුරුෂභාවය නිසා සිදුවන හිංසන අවස්ථාවන් හඳුනාගැනීමටත් ඉන් මිදීමටත් අවශ්‍ය නීතිමය උපදෙස් ලබා ගැනීමේ මාර්ග පිළිබඳවත් දැනුම ලබා දීම, තැනැත්තන් වෙළදාම, තැනැත්තන් වෙළදාමට හසුවන අවස්ථා හඳුනාගැනීම, ලිංගික සූරාකෑම් යනාදිය පිළිබඳව කාන්තාවන් දැනුවත් කිරීම මෙම වැඩ සටහනින් බලාපොරොත්තු වේ. ප්‍රතිලාභීන් 6056 ක් වෙනුවෙන් වැඩ සටහන් 60 ක් මෙම වසරේ සිදුකර ඇති අතර, ඒ සඳහා රු.මිලියන 1.4843 ක් වැය වී ඇත.

## ➢ සුව දිවියට පෝෂණ වැඩ සටහන

අනාගත සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් උදෙසා සෞඛ්‍යය, පෝෂණය, සනීපාරක්ෂණය පිළිබඳව දැනුම කාන්තාවන්ට අත්‍යවශ්‍ය වේ. මෙමගින් නීරෝගී ප්‍රජාවක් ජාතික සංවර්ධනයට දායක කරවීමට හැකියාවක් ඇතිවන අතර රාසායනික ද්‍රව්‍ය අවභාවිතයෙන් ආහාර නිෂ්පාදනය සඳහා පෙළඹවීමක් සිදු කිරීම කරනු ලබයි. වැඩ සටහන් 56 ක් ප්‍රතිලාභීන් 4814 ක් උදෙසා සිදු කර ඇති අතර, ඒ සඳහා රු.මිලියන 1.4671 ක් වැය කර ඇත.

## ➢ වතුකරයේ කාන්තාවන් සඳහා මූල්‍ය කළමනාකරණ වැඩ සටහන

සමාජීය, ආර්ථික හා සංස්කෘතික වශයෙන් වතුකරයේ කාන්තාවන්ගේ තත්ත්වය ඉහල නැංවීම සඳහා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාවට නංවමින් පෝෂණය වැඩි දියුණු කිරීම, මත්ද්‍රව්‍ය නිවාරණය, විදේශගතවීමට අපේක්ෂාවෙන් සිටින වතුකරයේ කාන්තාවන් විකල්ප ආදායම් මාර්ග සඳහා පෙළඹවීමටත්, අධ්‍යාපනය, කුට්ටනය හා හිංසාව අවම කිරීම සඳහාත්, වතු ප්‍රජාව වාසය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ප්‍රතිලාභීන් 5600 ක් සම්බන්ධ කර ගනිමින් වැඩ සටහන් 50 ක් ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා රු.මි. 1.9998 ක් වැය කර ඇත.

- **නව යෞවනියන්ගේ ජීවන කුසලතා හා ප්‍රජනන සෞඛ්‍ය වැඩ සටහන**

නව යොවුන්වියේ ගැහැණු දරුවන්ගේ කුසලතාවය හා දැනුම වර්ධනය කිරීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි නව යෞවනියන් 20130 දෙනෙකු සම්බන්ධකර ගනිමින් වැඩ සටහන් 100 ක් පවත්වා ඇත. මේ සඳහා රු.මි.1.9867 ක් දරා ඇත.

### 1. කාන්තා සංවිධාන ජාලය ශක්තිමත් කිරීම

කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන්ගේ සංවර්ධනය වෙනුවෙන් කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කිරීමට සංවිධාන ජාලයක් බිහිකිරීම හා ඔවුන් නායකත්වයට පුහුණු කිරීම සඳහා පිහිටුවා ඇති ග්‍රාමීය මට්ටමේ වූ කාන්තා කාර්ය සංවිධාන, ප්‍රාදේශීය කාන්තා බල මණ්ඩල හා දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩල ශක්තිමත් කිරීම, යටිතල පහසුකම් ඇතුළු සේවා සැපයීම. මේ සඳහා රු.මි. 0.9874 ක් වැය කර ඇත.

### 2. බන්ධනාගාරගත කාන්තාවන් සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ වැඩ සටහන්

සුළු වැරදිමත බන්ධනාගාර ගත කාන්තාවන් නැවත නැවත එම වැරදි වලට යොමුවීම වලක්වා යහපත් අයුරින් සමාජගත කිරීම සඳහා මෙම වැඩ සටහන බන්ධනාගාර තුළ ක්‍රියාත්මක කරනු ලබයි. මෙහිදී මැහුම් පාඨමාලා හා අත්කම් නිෂ්පාදන පිළිබඳව පුහුණු වීම් ලබා දෙනු ලබයි. ප්‍රතිලාභීන් 488 ක් සඳහා වැඩ සටහන් 11 ක් 2016 වර්ෂයේ පවත්වා ඇත. මේ සඳහා රු.මි.0.4974 ක් වැය කර ඇත.

### 3. වෙනත් වැඩ සටහන්

දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කටයුතු, නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩ සටහන්, මාධ්‍ය ප්‍රචාරණය හා පුස්තකාලය පවත්වාගෙන යාම යන කාර්යයන් ඉතා සාර්ථකව ඉටු කර ඇති අතර, මේ සඳහා 2016 වර්ෂයේ දී රු.මිලියන 2.2793 ක් වැය කර ඇත.





## ජාතික කාන්තා කමිටුව

**දැක්ම**

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකික සමාජයක්

**මෙහෙවර**

ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම සඳහා නිර්දේශ හා සහය ලබා දීම සහ නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට පෙළඹවීම හා අධීක්ෂණය කර ඇගයීම.

**ප්‍රධාන කාර්ය භාරය**

- ස්ත්‍රී පුරුෂභාවය මත ඇතිවන වෙනස්කම් පිළිබඳ වූ පැමිණිලි බාරගැනීම්, සංනිරීක්ෂණය හා ඒවා අදාළ පාලක, බලධාරීන්, සම්බන්ධිත තැනැත්තන් හෝ මණ්ඩල වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම.
- කාන්තා ප්‍රඥප්තියේ ඇතුළත් විධිවිධාන කඩකිරීම සම්බන්ධයෙන් වන පැමිණිලි, සහන, නෛතික ආධාර හෝ සමථ සේවා සඳහා රජයේ හෝ රජයේ නොවන හෝ සංවිධාන වෙත යොමු කිරීම.
- එම ක්‍රියාමාර්ග සමීක්ෂණය, අදාළ පාලන බලධාරීන්ගෙන් වාර්ෂික ප්‍රගති වාර්තා ලබා ගැනීම සහ එම වාර්තා රට තුළ ප්‍රචලිත කිරීම ආදියට අවස්ථා සැලසීම.
- ප්‍රඥප්තියේ අන්තර්ගතව ඇති පරිදි, කාන්තා අයිතිවාසිකම් සහ වගකීම් විෂයෙහි නෛතික සහ සංවර්ධන ප්‍රතිපත්ති වලින් ඇතිවන බලපෑම් ඇගයීම.
- අදාළ පර්යේෂණ දිරිගැන්වීම තුළින් ප්‍රඥප්තියේ අරමුණු සපුරා ගැනීමට උපකාරී වීම සහ එම පර්යේෂණ පදනම් කර ගත් ප්‍රතිසංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳව විෂයභාර අමාත්‍යවරයා විසින් කමිටුවේ අවධානයට යොමු කෙරෙන කරුණු පිළිබඳව හෝ උචිත යැයි කමිටුව සිතන කටයුතු කිරීමට උපදෙස් දීම.

## ක්‍රියාවට නංවන ලද වැඩ සටහන් හා ප්‍රගතිය

### ➢ නීති සංශෝධන කටයුතු පිළිබඳ සාකච්ඡා පැවැත්වීම

මේ සඳහා රු. 34, 405.00 ක මුදලක් වැය කරන ලදී.

### ➢ පෙළඹවීම්, දැනුවත් කිරීම්, ධාරිතා සංවර්ධන වැඩ සටහන්

ස්ත්‍රී පුරුෂ සමාජභාවී මූලප්‍රවාහකරන වැඩසටහන, සේවා ස්ථානයේ හිංසන වැළැක්වීම උදෙසා ආයෝජන මණ්ඩලයේ හා නිදහස් වෙළඳ කලාප ආයතනයන්හි වැඩසටහන් පැවැත්වීම, වතු ක්ෂේත්‍රයේ කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම, ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ වැඩසටහන් හා එක්සත් ජාතීන්ගේ දින 16 වැඩසටහන පවත්වන ලදී. මේ සඳහා රු.2,222,769.50 ක් වැය කරන ලදී.

### ➢ ප්‍රතිපත්ති හා පර්යේෂණ

සීඩෝ වාර්තාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ඉදිරිපත් කරන අවසන් නිරීක්ෂණ පිළිබඳ කටයුතු කිරීම, බීජිං ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කිරීම, අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකාරීත්වය තුරන් කිරීම, අවිධිමත් අංශයේ හා කෘෂිකර්මයේ නියුතු කාන්තාවන් ආරක්ෂා කිරීම පිළිබඳ වැඩසටහන් පවත්වන ලද අතර, වතු අංශයේ කාන්තාවන්ට සිදුවන හිංසනය, ළමා මව්වරුන් පිළිබඳ පර්යේෂණය, සයිබර් අපරාධ පිළිබඳ පර්යේෂණය හා සුළු කෘෂිකාර්මික නිෂ්පාදන වතු වල (තේ, පොල්, රබර්) සේවයේ නියුතු කාන්තාවන්ට සිදු වන වෙනස්කොට සැලකීම පිළිබඳ පර්යේෂණයන් පවත්වන ලදී. මේ සඳහා රු. 1,003,267.00 ක මුදලක් වැය වන ලදී.

### ➢ මණ්ඩප සාකච්ඡා

ගෘහ මූලික සංකල්පය, කාන්තාව හා කුට්ටනය, මුස්ලිම් නීතිය හා දේශපාලනයේ කාන්තා නියෝජනය පිළිබඳ දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡාවන් පවත්වන ලදී. මේ සඳහා රු. 370,738 ක් වැය කර ඇත.

### ➢ මාධ්‍ය වැඩ සටහන් හා මාධ්‍ය ප්‍රකාශ සංවර්ධනය කිරීම

පැමිණිලි මධ්‍යස්ථානයට ලැබෙන පැමිණිලි පිළිබඳ ගුවන්විදුලි වැඩසටහන් පැවැත්වීම, ප්‍රගතියේ හවුල්කරුවෝ වාර්ෂික සඟරාව මුද්‍රණය, වනිතා විභව කාර්තු සඟරාව මුද්‍රණය, මාධ්‍ය ප්‍රකාශන සංවර්ධනය යටතේ බාල වයස ගැබ් ගැනීම් අවම කිරීම උදෙසා පොත් පිංච මුද්‍රණය හා සේවා ස්ථාන වල සිදු වන ලිංගික හිංසන අවම කිරීම උදෙසා පෝස්ටරයක් සැකසීම හා බාල වයස් ගැබ්

ගැනීමෙන් ඇති වන ප්‍රතිවිපාක තුරන් කිරීම සඳහා වාර්තා චිත්‍රපටය නිෂ්පාදනය කරන ලදී. මේ සඳහා රු. 1,582,876 ක් වැය කර ඇත.

- **දේශපාලනයේ කාන්තා සහභාගීත්වය වර්ධනය කිරීමේ වැඩසටහන්**

පේරාදෙණිය විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව සහතික පත්‍ර පාඨමාලාවක් පැවැත්වීම හා දේශපාලනයට පිවිසීමට කැමති පළාත් පාලනයට තේරී පත් වූ කාන්තාවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී. මේ සඳහා රු. 1,060,323 ක මුදලක් වැය කරන ලදී.

- **1938 කාන්තා උපකාරක දුරකථන සේවාව හා පැමිණිලි මධ්‍යස්ථානය ශක්තිමත් කිරීමේ වැඩසටහන්**

මේ යටතේ 1938 ධාරිතා සංවර්ධන වැඩසටහන්, මෙහෙයුම් කමිටු රැස්වීම්, 1938 හා පැමිණිලි මධ්‍යස්ථාන ප්‍රචාරණ කටයුතු හා 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව හා පැමිණිලි මධ්‍යස්ථානය හා සම්බන්ධිත ආයතන සමඟ සාකච්ඡා පවත්වන ලද අතර, ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් ද වැඩසටහන් දියත් කරන ලදී. තවද ප්‍රතිපත්තිමය සාකච්ඡා පැවැත්වීමට අමතරව වෙනත් වැඩසටහන් ද පවත්වන ලදී. මේ සඳහා රු. 830,703.50 ක මුදලක් වැය කරන ලදී.

## ළමා ලේකම් කාර්යාලය

**දැක්ම**

**ශාරීරික ,මනෝ සමාජීය සහ ප්‍රජානන සංවර්ධනයෙන් යුතු ශ්‍රී ලාංකේය මුල් ළමාවිය දරු පරපුරක් බිහි කිරීම.**

**මෙහෙවර**

ජාතික මට්ටමේ කේන්ද්‍රීය ආයතනය ලෙස ප්‍රතිපත්ති හා වැඩ සටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා පසු විපරම් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය දරුවන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම.

**ප්‍රධාන කාර්යභාරය**

- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ලෙස කටයුතු කිරිම.
- රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩ සටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරිම.
- මුල් ළමාවිය සත්කාරය හා සංවර්ධනයට අදාළ වන පර්යේෂණ සිදු කිරීම, දත්ත රැස් කිරීම සහ වැඩ සටහන් සම්පාදනය කිරීම.
- මුල් ළමාවියේ දරුවාගේ සමස්ථ සංවර්ධනය සඳහා අදාළ වන පුහුණු වැඩ සටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරිම.
- මුල් ළමාවියේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරිම සහ ඔවුන් තුළ ඒ පිළිබඳ සංවේදීභාවයක් ඇති කිරීම.

## ක්‍රියාවට නංවන ලද වැඩ සටහන් හා ප්‍රගතිය

### විශේෂ වැඩ සටහන්

- **ගර්භණී මව්වරුන්ට රු.20,000/- පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන**

අඩු බර දරු උපත් ශ්‍රී ලංකාව තුළ අවම කිරීමේ අරමුණින් සෑම ගර්භණී මවකටම රු. 20,000/- ක පෝෂණ දීමනාවක් මසකට රු. 2,000/- බැගින් මාස 10ක් සඳහා ලබාදීමට මෙම වැඩසටහන 2015 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. ගර්භණී සමයේ මවකට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ අඩංගු ආහාර ද්‍රව්‍යවලින් සමන්විත පෝෂණ ඇසුරුමක් ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ලියාපදිංචි වන සෑම ගර්භනී මවක් සඳහාම මෙම දීමනාව (කූපන්පත් භාවිතය මගින් ) මෙම වසරේ අප්‍රේල් මස දක්වා හිමිවිය. එහෙත් මව්වරුන්ට නිර්දේශිත ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම පහසු කිරීම හා වැඩසටහන ක්‍රියාත්මක කිරීම පහසු කිරීමේ අරමුණින් මෙම වසරේ මැයි මාසයේ සිට කූපන්පත් වෙනුවට වවුචර්පත් නිකුත් කිරීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත. මේ යටතේ රු. 2,000/- ක වටිනාකමින් යුතු වවුචර් 10 ක් එකවර ලබා දේ. ගර්භනී සමයේ අවසන් මාස 06 හා කිරි දෙන සමයේ පළමු මාස 04 සඳහා එම පෝෂණ ද්‍රව්‍ය සමස්ථය ලබා ගැනීමට හැකියාව ඇත. මේ සඳහා රු.මි. 7,500/- ක් වෙන් කර ඇති අතර, 2016 වර්ෂය අවසන් වන විට වියදම රු.මි. 5,746.413 ක් වන අතර ආසන්න වශයෙන් පෝෂණ ඇසුරුම් 2,869,465ක් ප්‍රතිලාභීන් අතර බෙදී ගොස් ඇත.

- **පෙර පාසල් ළමුන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන**

2016 වර්ෂයේදී මෙම වැඩසටහන සඳහා මහා භාණ්ඩාගාරය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 300කි. එයින් රු.මි. 127.9 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර 2016 වර්ෂය අවසන් වන විට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 2,207 ක දරුවන් 67,988 දෙනෙකු මෙම වැඩසටහනේ ප්‍රතිලාභීන් බවට පත්ව ඇත. දිස්ත්‍රික්ක 25හිම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 130 ක ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන සඳහා 2016 වසර අවසන් වන විට රු.මි. 106.429 ක මුදලක් වැය කර ඇත.





පෙර පාසල් ළමුන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන

**මාතලේ දිවා සුරැකුම්** මධ්‍යස්ථානය





**අනුරාධපුර දිවා සුරැකුම්** මධ්‍යස්ථානය






- **ළමා අපයෝජන හා කාන්තා හිංසනය වැළැක්වීම පිළිබඳ ව්‍යාපෘතිය (රු. මිලියන 700)**

2016 වසරේදී රු.මි.19.47 වෙන් කර දී ඇති අතර එම ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. මේ වන විට කිලිනොච්චිය, පොළොන්නරුව, මාතලේ යන දිස්ත්‍රික්කවල ඉදිකරන ලද දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැඩ නිමකර ජනතා අයිතියට පත්කර ඇති අතර ඉදිවෙමින් පවතින දිවා සුරැකුම් මධ්‍යස්ථාන වන්නේ මොණරාගල, නුවරඑළිය, මඩකලපුව සහ අනුරාධපුරයයි. එම දිවා සුරැකුම් මධ්‍යස්ථාන ද කඩිනමින් ජනතා අයිතියට පත්කිරීමට අපේක්ෂිතය.

- **ළමා දිරිය පෙර පාසල් ගුරුවරියන් සඳහා රු.250/- ක් ලබාදීමේ වැඩසටහන**

පෙර පාසල්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සේවාවන් වඩාත් ශක්තිමත් හා වැඩිදියුණු කිරීමේ අරමුණින් 2015 අතුරු අයවැය යෝජනා යටතේ පෙර පාසල්/මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරියන් සඳහා මාසිකව රු. 250/- ක දීමනාවක් 2015 ජූනි මස සිට ගෙවීමට තීරණය කරන ලද අතර, එය ක්‍රියාවට නැංවීමේ කටයුත්ත මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන ආයතනය වන ළමා ලේකම් කාර්යාලය වෙත පැවරිණි. ඒ අනුව 2016 වසරේදී රු.මි.30ක් මෙම වැඩසටහනට වෙන් කරන ලද අතර

සුදුසුකම් ලැබූ පෙරපාසල් ගුරුවරියන් 4,159 සඳහා පළමු වාරිකයේදී ද 4,126 දෙනෙකු සඳහා දෙවන වාරිකයේ දී 3,636 දෙනෙක් සඳහා තුන්වන වාරිකයේ දී ද වශයෙන් රු.මි.11.728 ක මුදලක් වැයකරමින් 2016 වසරේ මාස 12 සඳහා ම මෙම දීමනාව ලබා දී ඇත.

## මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ අනෙකුත් වැඩසටහන්

මේ යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.50 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර පහත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක වේ.

- **''සෙනෙහෙ තටාක'' නිවස පදනම් කරගත් මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන**

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ නිවස ආශ්‍රිත පරිසරය සහ නිවසේ එදිනෙදා සිදුකරනු ලබන කාර්යයන්වලදී මුල් ළමාවියේ දරුවන් සම්බන්ධ කරගැනීම මගින් ඔවුන්ගේ සමස්ත සංවර්ධනය ඇති කිරීමයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දෙමාපියන් දැනුවත් කිරීම, රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම, තරුණ කණ්ඩායම් දැනුවත් කිරීම වැනි කාර්යයන් මේ යටතේ සිදු කරනු ලබයි. 2016 වර්ෂයේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් වැඩසටහන් 304 ක් සඳහා රු.මි. 1.580 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර වැඩසටහන් 281ක් පවත්වා ඇත. එහි මූල්‍ය ප්‍රගතිය රු.මි. 1.474 කි.

එමෙන්ම මේ යටතේ දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් 25 ක් පැවැත්වීම සඳහා එක් දිස්ත්‍රික්කයකට රු. 32,000 ක් බැගින් රු.මි. 0.8ක් ලබා දී දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් 21 ක් පවත්වා ඇති අතර, වියදම රු.මි. 0.664 කි.

- **''පෝෂණ මංපෙත'' ආහාර හා පෝෂණ වැඩසටහන**

මුල් ළමාවියේ දරුවන්ගේ ආහාර හා පෝෂණය පිළිබඳ දෙමාපියන් හා පෙර පාසල් ගුරුවරියන් දැනුවත් කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් 304 ක් සඳහා රු.මි. 2.432 ක ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර, 2016 වසර අවසන් වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් 278 ක් පවත්වා ඇති අතර, ඒ සඳහා වැය වී ඇති මුදල රු.මි. 2.21 කි.

- **දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු**

සෑම වගකිව යුතු අංශයකම සහභාගීත්වයෙන් ළමුන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා 2016 වර්ෂයේ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා වෙන්ව තිබූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 0.75 කි. ඒ අනුව කමිටු 58 ක් සඳහා 2016 වර්ෂය අවසාන වන විට රු.මි. 0.492 ක මූල්‍ය ප්‍රගතියක් ළඟා කරගෙන ඇත.



දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම

- **මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික / ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ක්‍රියාත්මක කිරීම.**

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය, 2004 ප්‍රතිපත්තියට අනුකූලව මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික හා ප්‍රාදේශිය කමිටු පැවැත්වීම සඳහා රු.මි. 1.192 ක ප්‍රතිපාදන වෙන්කර ඇත. ඒ අනුව ජාතික මට්ටමේ කමිටු 3 ක් පළාත් මට්ටමේ කමිටු 8ක්ද ප්‍රාදේශීය මට්ටමේ කමිටු 491ක් ද පවත්වා ඇති අතර, එහි වියදම රු.මි.0.614කි.

- **මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම**

ක්ෂේත්‍රය තුළ රාජකාරී කටයුතුවල නිරත වන දිස්ත්‍රික් මුල් ළමාවිය සම්බන්ධීකරණ නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජකාරී කටයුතුවල නිරත මුල් ළමාවිය සංවර්ධන සහකාර නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 143 ක් සහ ජාතික රැස්වීම් 04 ක් මේ වන විට පවත්වා ඇත. මේ සඳහා වැය වී ඇති මුදල රු. මි. 0.444 කි.

- **මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය, යාවත්කාලීන කිරීම හා එය පනතක් බවට පත් කිරීම.**

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ 2004 **දී එළි දක්වන ලද** ජාතික ප්‍රතිපත්තිය දැනට ක්‍රියාත්මක කරමින් පවතින අතර, එම ජාතික ප්‍රතිපත්තිය නීතිමය වශයෙන් බලගැන්වීම සඳහා පනතක් බවට පත්කිරීමේ අරමුණින් හා වර්තමානයේ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණයට ගැළපෙන පරිදි ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කර නැවත මුද්‍රණය කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. ඊට සමගාමීව මුල් ළමාවිය සංවර්ධන පනත් කෙටුම්පත සකස් කරමින් පවතී. මේ සඳහා වෙන් කරන ලද මුදල රු.මි. 1.075කි. මේ සම්බන්ධව රැස්වීම් 3 ක් පවත්වා ඇති අතර, මූල්‍ය ප්‍රගතිය රු.මි. 0.915 කි.

- **මුල් ළමාවිය රැකවරණය පිළිබඳ ජාලය පවත්වා ගැනීම.**

ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව කටයුතු කරන රාජ්‍ය, රාජ්‍ය නොවන හා පුද්ගලික අංශයේ ආයතනයන් හා පුද්ගලයන් සම්බන්ධ කරගනිමින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාලයක් (ECCD Network) ළමා ලේකම් කාර්යාලය මගින් ස්ථාපිත කර ඇති අතර, ඒ වෙනුවෙන් රු.මි.0.650ක් වෙන්කර ඇත. ඒ අනුව ඊට අදාළ වන මූලික රැස්වීම් වාරයක් පවත්වා ඇති අතර, ඒ සඳහා වැය වී ඇති මුදල රු.මි. 0.049කි. ඉදිරියේ දී මේ සම්බන්ධව තවදුරටත් රැස්වීම් පැවැත්වීමට නියමිත ය.

- **"නිවැරදි ආරම්භයට" මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවම ප්‍රමිතීන් ග්‍රන්ථය යාවත්කාලීන කිරීම**

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවම ප්‍රමිතීන් ග්‍රන්ථය සංශෝධනය කර මුද්‍රණය කිරීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට සිදුකර ඇත. මේ හා සම්බන්ධව දින දෙකක වැඩමුළුවක් පවත්වා ඇති අතර, දරා ඇති වියදම රු.මි. 0.712 කි.

- **මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන් හඳුන්වා දීමේ වැඩසටහන**

අප රටේ මේ දක්වා මුල් ළමාවියේ දරුවන්ගේ සංවර්ධනය මැනීම සඳහා ප්‍රමිතීන් හෝ දර්ශක තිබුණේ නැත. ළමා ලේකම් කාර්යාලය මගින් මේ වන විට දීප ව්‍යාප්ත මට්ටමින් පර්යේෂණ පවත්වා සියළු පළාත් සභාවල මුල් ළමාවිය සංවර්ධන අධිකාරි සහ කාර්යාංශවල නිසි බලධාරින්ගේ එකඟතාවය මත ''මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන්'' සකස් කර ඇත. (වයස අවු. 3 - 5 වයස් කාණ්ඩයේ ළමුන් සඳහා) මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන් 2015 වසරේ දී ජාතික මට්ටමින් එළිදක්වන ලද අතර ඒවා "ජාතික ප්‍රමිතීන් " බවට නම් කර අනුමැතිය ලබා ගැනීම සඳහා මේ වන විට ගරු අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. මෙම මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන්, පෙර පාසැල් ගුරු පුහුණු අත් පොතක් වශයෙන් සකස් කර ඇති අතර, එය පෙර පාසැල් ගුරුවරියන්ට හඳුන්වා දීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා පුහුණුකරුවන් පිරිසක් පළාත් මට්ටමෙන් පුහුණු කරනු ලබන අතර, 2016 වර්ෂය අවසාන වන විට පළාත් 09 ම ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් පවත්වා ඇති අතර, දකුණ, බස්නාහිර, මධ්‍යම, ඌව, යන පළාත්වල සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පෙර පාසල් ගුරුවරියන් සඳහා පුහුණු වැඩසටහන් 149 ක් පවත්වා ඇත. මෙහි මූල්‍ය ප්‍රගතිය රු.මි. 4.101 කි.

- **පෙර පාසල් ගුරුවරුන් සඳහා ජාතික මට්ටමේ විභාගයක් පැවැත්වීමට ක්‍රමවේදයක් සැකසීම හා පෙර පාසැල් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ආධාර ලබා දීම**

පෙර පාසැල් ගුරුවරුන් සඳහා ජාතික මට්ටමේ විභාගයක් පැවැත්වීම සම්බන්ධව මූලික ක්‍රමවේදයක් සැකසීම සඳහා ඊට අදාල ආයතන සමඟ මූලික සාකච්ඡා මේ වසරේ අවසන් කර ඇත. ඒ සඳහා වෙන් කර ඇති මුදල රු.මි. 0.05 ක් වන අතර, දරා ඇති වියදම රු. 620.00කි.

ඉදිරි වර්ෂවලදී එම ක්‍රමවේදය හා සම්බන්ධ කටයුතු තව දුරටත් සංවර්ධනය කිරීමට අපේක්ෂිත ය. මීට අමතරව නොමිලේ පවත්වන පෙර පාසැල් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ආධාර ලබාදීම වෙනුවෙන් රු.මි.0.2ක් වෙන් කර ඇති අතර, එහි මූල්‍ය ප්‍රගතිය රු.මි.0.2කි.

## ➢ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ලියාපදිංචි කිරීමේ වැඩසටහන

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා (පෙර පාසැල් ගුරු පුහුණු) පාඨමාලා ජාතික මට්ටමේ ප්‍රමිතීන්ගෙන් යුක්ත බවට සහතික කොට ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ යටතේ ජාතික මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා 61 ක් ලියාපදිංචි කර ඇති අතර, මෙම පාඨමාලාවල ප්‍රමිතිය නියාමනය කිරීම සඳහා පසුවිපරම් යාන්ත්‍රණයක් සකස් කර ඇත. ඒ සඳහා රු.මි. 0.15 ක් වෙන් කර ඇත. එහි මූල්‍ය ප්‍රගතිය රු.මි. 0.032 කි.

## ➢ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය සම්බන්ධ පර්යේෂණ සහ සමුළුව

මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය සම්බන්ධව පර්යේෂණ 5 ක් මේ වන විටත් සිදුකෙරෙමින් පවතින අතර, ඊට අදාළ මූලික කටයුතු මේ වන විටත් සිදුවෙමින් පවතී. ඉදිරි වර්ෂ වලදී මෙම පර්යේෂණ සිදුකර අවසන් කිරීමට අපේක්ෂිත ය.

## ➢ ''අරුණ දකින රටා'' මුල් ළමාවියේ දරුවන්ගේ සිතුවම් ප්‍රදර්ශනය සහ වැඩමුළුව

මුල් ළමාවියේ දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතාවයන් ඔප් නැංවීම සඳහා වාර්ෂිකව දීප ව්‍යාප්ත මට්ටමින් සිතුවම් ප්‍රදර්ශනයක් පවත්වනු ලබයි. මේ සඳහා දිවයිනේ සෑම පළාතක්ම නියෝජනය වන පරිදි පෙර පාසැල් දරු දැරියන්ගේ සිතුවම් ලැබෙන අතර, ඒ අතරින් තෝරාගනු ලබන චිත්‍ර 500 කින් යුක්තව මෙම ප්‍රදර්ශනය කොළඹදී පවත්වා, අදාළ දරු දැරියන්ට ත්‍යාග සහ සහතිකපත් ලබාදීම සිදුකෙරේ. පසුගිය වසරවල මෙම වැඩසටහන සැප්තැම්බර් මාසයේදී පවත්වනු ලැබූ අතර, ප්‍රායෝගික හේතු මත මෙම වසරේදී එය ඔක්තෝම්බර් මස 27 වන දින බත්තරමුල්ල ''අපේ ගම'' පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 4.5 කි. ඒ අනුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් චිත්‍ර ඇඳීමේ වැඩසටහන් 331 ක් සිදු කිරීම සඳහා රු.මි. 1.986 ක ප්‍රතිපාදන නිදහස් කර ඇත. ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් පවත්වා තෝරාගනු ලබන චිත්‍ර මගින් ජාතික මට්ටමේ ''අරුණ දකින රටා'' චිත්‍ර වැඩමුළුව හා ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා චිත්‍ර තෝරා ගැනීමේ දිස්ත්‍රික් වැඩසටහන් 25 ක් පවත්වා ඇත. ඒ අනුව මෙම වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ මුදලම වියදම් වී ඇත.



''අරුණ දකින රටා'' ප්‍රාදේශීය වැඩසටහන

## ➢ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය

2010 වර්ෂයේ දී කැබිනට් මණ්ඩල අනුමැතිය මත දෙසැම්බර් 14 සිට 20 දක්වා ක්‍රියාත්මක කරන ලද මෙම ජාතික සතිය මෙම වසරේදී ජූලි මස 14 සිට 20 දක්වා සංශෝධනය කර පැවැත්වීමට කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී. මෙහි ඉලක්ක කණ්ඩායම් වන්නේ මුල් ළමාවිය ප්‍රතිපත්ති සම්පාදකයන්, පෙර පාසැල් දරුවන්, පෙර පාසැල් ගුරුවරියන්, ක්ෂේත්‍රයේ නියුතු නිලධාරීන්, දෙමාපියන්, ගැබිණි මව්වරුන් ආදියයි. ඒ අනුව එම ඉලක්ක කණ්ඩායම් වෙත ප්‍රතිලාභය වශයෙන් පෙර පාසැල් සඳහා අධ්‍යාපන උපකරණ ලබාදීම, ආදර්ශ ගම්මාන යටතේ පෙර පාසැල් ගොඩනැගිලි ඉදිකිරීමට ආධාර ලබාදීම, දැනුවත් කිරීමේ වැඩසටහන්, ළමයින් සඳහා සෞන්දර්යාත්මක වැඩසටහන් යනාදී කාර්යයන් මෙම වසරේදී සිදු කරන ලදී. මෙම ජාතික සතිය තුළදී ජනමාධ්‍යයන් තුළින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. මෙවර ''දරු කැළ මුල් ළමාවියේ හෙට දින ජීවයයි දැයේ'' යන්න තේමා කර ගනිමින් **මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය සමරන ලද අතර, එහිදී** ආපදා ආරක්ෂණය හා මුල් ළමාවිය රැකවරණය සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන ලදී.

2016 වර්ෂය සඳහා රු.මි. 4.5 ක ප්‍රතිපාදන මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර, වාර්තාගත වියදම රු.මි. 4.474 කි. ඒ අනුව මේ වනවිට සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි ප්‍රාදේශීය වැඩසටහන් 284 ක් සහ ජාතික වැඩසටහන් 07 ක් පවත්වා ඇත.






මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය වැඩසටහන්

## ➢ ලෝක ළමා දිනය

ලෝක ළමා දිනය වෙනුවෙන් පවත්වනු ලබන ජාතික වැඩසටහන කෑගල්ල ශාන්ත ජෝශප් බාලිකා ප්‍රාථමික විදුහලේදී පවත්වන ලදී. ඊට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් විවිධ දැනුවත් කිරීමේ වැඩමුළු සහ පෙර පාසැල් දරුවන් සඳහා රසවින්දනාත්මක වැඩසටහන් යනාදිය ක්‍රියාත්මක කිරීම සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට රු.12,000.00 බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 304ක් සඳහා රු.මි.3.648 ක ප්‍රතිපාදන නිදහස් කරන ලදී. ඒ අනුව ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් 289 ක් පවත්වා ඇති අතර ලෝක ළමා දින ජාතික වැඩසටහන සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සඳහා වැය වී ඇති සම්පූර්ණ මුදල රු.මි. 8.052 කි.




ලෝක ළමාදින ජාතික උත්සවය

## ➢ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන / පෙර පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන

පෙර පාසල් සංවර්ධනය කිරීම පිණිස අවශ්‍ය වන ඉගෙනුම් පරිසරය සඳහා අනුග්‍රහය ලබාදීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණයි. මේ යටතේ පෙර පාසැල් සඳහා සෙල්ලම් මිදුල් ලබාදීම සහ අත්‍යවශ්‍ය පෙර පාසැල් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම වැනි කාර්යයන් සිදු කරනු ලැබේ.

පෙර පාසැල් සහ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශවල සෙල්ලම් මිදුල් ඉදිකිරීම යටතේ 2016 වර්ෂයේ දී සෙල්ලම් මිදුල් 50 ක් ඉදිකිරීම සඳහා රු. මි.2.5 ක ප්‍රතිපාදන වෙන් කළ අතර, එම මුදලින් පෙර පාසල් / මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සෙල්ලම් මිදුල් 38 ක් සහ පොලිස් ස්ථානවල ළමා

හා කාන්තා කාර්යාංශයන්හි සෙල්ලම් මිදුල් 12 ක් ද වශයෙන් සෙල්ලම් මිදුල් 50 ක් ඉදිකර ඇත. මේ සඳහා වැය වී ඇති මුදල රු.මිලියන 2.4949 කි.

පෙර පාසැල් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය යටතේ 2016 වර්ෂයේ පෙර පාසල්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 10 ක ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.මි. 5 ක් වෙන්කර ඇත. ඒ අනුව රත්නපුර, කළුතර, මහනුවර, අම්පාර, හම්බන්තොට, කිලිනොච්චිය, කුරුණෑගල, ගාල්ල, වවුනියාව සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වල පිහිටි පෙර පාසැල් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කරන ලද අතර, ඒ සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ මුදල ම වැය වී ඇත.

- **මුල් ළමාවිය සංවර්ධන ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය**

දිවයිනේ තෝරාගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තෝරාගන්නා ලද ග්‍රාම නිලධාරී වසම්වලින් සුදුසු ගම්මාන තෝරාගෙන එහි ජනතාව මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දැනුවත්භාවයෙන් සහ සංවේදීතාවයෙන් යුක්ත පිරිසක් බවට පත්කිරීමේ අරමුණින් එම ගම්මාන‘‘ආදර්ශ මුල් ළමාවිය සංවර්ධන ගම්මාන’’ ලෙස දියුණු කිරීම කරනු ලැබේ.

2016 වර්ෂයේ මෙවැනි ආදර්ශ ගම්මාන 6 ක් පිහිටුවීම සඳහා රු.මි. 2 ක් වෙන්කරන ලද අතර, එම ඇස්තමේන්තු ගත මුදල ම වර්ෂය අවසාන වන විට වියදම් වී ඇත. එමගින් ආදර්ශ ගම්මාන 06 ක් ක්‍රියාවට නංවා ඇති අතර, එම ගම්මානවල ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. මෙවර මෙම ආදර්ශ ගම්මාන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ සංවර්ධන අංශයේ කාන්තා ආදර්ශ ගම්මාන හා ඒකාබද්ධ වෙමින් ක්‍රියාත්මක කිරීම සුවිශේෂී කරුණකි. එම ගම්මාන අනුරාධපුර, බදුල්ල, පොලොන්නරුව, යාපනය, මඩකලපුව, වවුනියාව දිස්ත්‍රික්ක වල පිහිටා ඇති අතර, මූල්‍ය ප්‍රගතිය රු.මි. 0.8033 කි.

- **හදිසි අවස්ථාවක දී මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ වැඩසටහන**

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව මුලින් සැලසුම්කර නොමැති හදිසියේ ඇතිවන අවශ්‍යතා සහ ඒ ඒ අවස්ථාවන්වලදී සිදු කරනු ලබන ඉල්ලීම් අනුව කටයුතු කිරීමට රු.මි. 2.5 ක ප්‍රතිපාදන වෙන්කරන ලදී. මෙහිදී Unicef ආධාර යටතේ රු.මි. 13 කට ආසන්න මුදලකින් කොළොන්නාව ප්‍රදේශයේ ගංවතුරින් අනාථ වූවන්ට ද්‍රව්‍යමය ආධාර ලබාදුන් අතර, ළමා ලේකම් කාර්යාලයෙන් මේ සඳහා රු. 33,905.00 ක් වැය කර ඇත. ඉදිරියේ දී අනෙකුත් හදිසි ආපදා නිසා හානියට පත් වූ අත්‍යාවශ්‍යයෙන් සිදුකළයුතු ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මෙම ප්‍රතිපාදන ලබා දීමට බලාපොරොත්තු වේ. මේ යටතේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආපදාවට ලක් වූ පෙර පාසැලක් සඳහා රු.මි. 0.8 ක් ලබා දී ඇත. ඒ අනුව 2016 වර්ෂය තුළ මුල් ළමාවිය හදිසි අවස්ථාවන් සඳහා වෙන් කරන ලද මුදලින් රු.මි 2.2 ක් වැය වී ඇත.